සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- අංක 01 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරන්න

1) පුරාණ ගිවිසුම තුළ අඩංගු වන්නේ
(1) ඓතිහාසික සිදුවීම්ය (2) ගැළවීමේ ඉතිහාසයය
(3) කාලවකවානු හා පුද්ගල චරිතය (4) සභා ඉතිහාසය

2) ......................... හා ......................... පොත් වල මූලිකවම සඳහන් වන්නේ බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජීයිය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණුය
හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර වන්නේ
(1) රූත් කථාව හා එස්තර් කථාව (2) තෝබිත් කථාව හා ජුදිත් කථාව
(3) නෙහෙමියා හා එස්රා (4) එස්තර් කථාව හා තෝබිත් කථාව

3) ''ජේසුස් වහන්සේ කළ තවත් බොහෝ දේ ඇත. ඒවා එකිනෙක ලීවොත් ලියැවෙන ඒ පොත් වලට මුළු ලෝකය වුවත් ඉඩ මදි යැයි සිතමි'' මෙම ප්‍රකාශය සඳහන් වන්නේ
(1) මාක් ශුභාරංචියේය (2) රෝම ලිපියේය
(3) ගලාති ලිපියේය (4) ජොහන් ශුභාරංචියේය

4) පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් වන්නේ
A වීරාවලිය B ගණන් කථාව C ගීතාවලිය D 2 රාජාවලිය
මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ
(1) A හා D ය (2) A හා C ය (3) B හා D ය (4) C හා D ය

5) කතෝලික සභාව පැවත එන්නේ ..................... යුගයේ සිටය
(1) විනිශ්චකාරවරුන්ගේ (2) සභා පියවරුන්ගේ
(3) දිවැසිවරුන්ගේ (4) අපෝස්තලුවරුන්ගේ

6) ශුද්ධ වූ පාවුලු තුමාගේ දෙවන හා තෙවන ධර්මදූත චාරිකා වලට සම්බන්ධ වී ඇත්තේ
(1) ශුද්ධ වූ ස්තේපන් තුමාය (2) ශුද්ධ වූ මාක් තුමා ය
(3) ශුද්ධ වූ ලූක් තුමාය (4) ශුද්ධ වූ මතෙව් තුමාය

7) ග්‍රීසියේ ''අක්කාය'' නම් ස්ථානයේ දී ක්‍රි.ව. 80 – 90 අතර රචනා වී ඇති පොත වන්නේ
(1) මතෙව් ශුභාරංචියයි (2) එළිදරව් මාවත
(3) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාපොත (4) ලූක් ශුභාරංචිය

8) ශුද්ධ වූ ලූක් තුමා තම ග්‍රන්ථය පිළිගැන්වූයේ

(1) ශුද්ධ වූ ජුවාම් තුමාට (2) ශ්‍රීමත් තියෝපිලස් තුමාට
(3) ශුද්ධ වූ පාවුලු තුමාට (4) ශුද්ධ වූ ජාකොබ් තුමාට

9) නව ගිවිසුමට අයත් වෙනත් ලිපි වෙන්නේ

A හෙබ්‍රව් B ජාකොබ් C ගලාති
මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

(1) A, B හා C ය (2) A, B හා D ය (3) B, C හා D ය (4) A, C හා D ය

10) ශුද්ධ වූ පාවුලු තුමා ලියන ලද ගිවිසුමේ හසුන් පත් සංඛ්‍යාව වන්නේ

(1) 13 කි (2) 8 කි (3) 4 කි (4) 7 කි

11) ශුද්ධ වූ පාවුලු තුමා සිරගතව සිට ක්‍රිස්තු භක්තිකයින්ට විශ්වාසයේ ස්ථිරව සිටින ලෙස දන්වා යැවූ ලිපිය වන්නේ

(1) පිලිප් ලිපිය (2) ගලාති ලිපිය (3) කොලොස්සි ලිපිය (4) පිලෙමොන් ලිපිය

12) වෙනත් සංදේශ ලියූ කිතු සමිඳුන්ගේ අපෝස්තුලුවරුන් වූයේ

(1) ජාකොබ් / මතෙව් / ජොහන් (2) පේදුරු / ජුද් / ජාකොබ්
(3) ජාකොබ් / ජොහන් / පිලිප් (4) ජුද් / පේදුරු / මාක්

13) A තෙසලෝනික B 1 කොරොන්ති C එපීස D තීතස්
මින් ආරූඪ කතෘත්වයෙන් යුතු හසුන් වන්නේ

(1) A හා D ය (2) B හා D ය (3) A, B හා C ය (4) B, C හා D ය

pdfelement

14) ශුද්ධ වූ පාවුලු තුමා පිලමොන් නැමැති කිතුනු බැතිමතෙකුට ලියන ලද පෞද්ගලික ලිපිය ලියන ලද්දේ

(1) පළමු වන ධර්ම දූත චාරිකාවේ දීය (2) තුන් වන ධර්මදූත චාරිකාවේ දීය
(3) සිරගතව සිටින අවස්ථාවේ දීය (4) දමස්කස් නුවරට යන විටදීය

15) පාවුලු තුමා ලිපි ලියා ඇත්තේ ……………………….. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ

(1) ශුද්ධ වූ සභාවට හා පුද්ගලයන්ටය (2) ජුදා ජාතීන්ට හා මිසර වැසියන්ටය
(3) අපෝස්තුලුවරුන්ට හා සමරිතානුවරුන්ටය (4) විවිධ සංඝ වලට හා පුද්ගලයන්ටය

16)




මෙහි හිස්තැන් වලට අදාළ පිළිතුර වන්නේ

(1) යුගාන්ත වාදය / ගුප්තභාවය (2) ද්විත්ව වාදය / යුගාන්තවාදය
(3) විශ්වය / පූර්ණත්වය (4) සංකේත භාවිතය / යුගාන්තවාදය

17) යහපත් හා අයහපත බලවේග අතර ගැටුමක් පෙන්නුම් කරන්නේ
(1) සංකේත භාවිතය (2) යුගාන්තවාදය (3) ද්විත්ව වාදය (4) අභිධාර්මික ප්‍රඥාව

18) එළිදරව් සාහිත්‍යයේ එන 4 හා 10 සංඛ්‍යා සංකේත වලින් අදහස් කරන්නේ
(1) විශ්වීය හා දේව ජනතාව (2) විශ්වය හා පරිපූර්ණත්වය
(3) පූර්ණත්වය හා පරිපූර්ණත්වය (4) ඉශ්‍රායෙලය හා පූර්ණත්වය

19) එළිදරව් සාහිත්‍යයේ කර්තෘත්වය ……………………………………….. ආරූඪ කර ඇත.
හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ
(1) ජොහන් අපෝස්තුලු තුමාට (2) ජාකොබ් අපෝස්තුලුතුමාට
(3) පේදුරු අපෝස්තුලුතුමාට (4) මතෙව් අපෝස්තුලුතුමාට

20)

| ජයග්‍රහණය | යුද්ධය | සාගතය | මරණය |
|---|---|---|---|
| | රතු | | |

ඉහත හිස්තැන් වලට සුදුසු වර්ණ සංකේත වන්නේ
(1) කළු / සුදුමැලි / කහ (2) සුදු / සුදුමැලි / කළු
(3) කහ / කළු / සුදු (4) සුදු / කළු / සුදුමැලි

21) '' මම ළාබාල කෙනෙක්මි රට පාලනයේ දක්ෂකමක් මට නැත'' මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?
(1) දාවිත් රජතුමා විසින් සලමොන් රජතුමාට (2) යෙසායා දිවැසිවරයා විසින් දාවිත්ට
(3) සලමොන් රජතුමා විසින් දෙවියන් වහන්සේට (4) සලමොන් රජතුමා විසින් සාවුල් රජුට

22) ''හැම දෙයක දී ම සමිඳුන් සිහි කරන්න ……………….. '' මෙම වගන්තිය සම්පූර්ණ කරන්න.
(1) එතුමා ඔබට ප්‍රඥාව දෙනු ඇත (2) එතුමා ඔබට හරිමග පෙන්වනු ඇත
(3) එතුමා ඔබව නිවැරදි කරනු ඇත (4) එතුමා ඔබ අහන දෙය දෙනු ඇත

23) පැරණි ගිවිසුම තුළ ප්‍රඥාව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ '' හොක්මා'' ය. ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ
(1) පවුල හා ගෝත්‍රය සුරකෙන පිණිස වූ මඟපෙන්වීමයි.
(2) සාර්ථකව හා ධර්මිෂ්ඨව ජීවත් වීමේ හැකියාවයි.
(3) ජීවිත හරය එහි ගැටළු විනිශ්චය පිළිබඳව කෙරෙන විග්‍රහයයි.
(4) දෙවියන් වහන්සේට ප්‍රියමනාප දිවියක් ගත කිරීමට යොමු කිරීමයි.

24) ප්‍රඥා සාහිත්‍යය තුළ දක්නට ලැබෙන සාහිත්‍ය අංග වන්නේ
A ප්‍රස්ථා පිරුළු B ප්‍රේම ගී C සංකල්පනා D සංකේත
මේවා අතුරින් නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ
(1) A, C හා D ය (2) A, B හා D ය (3) B, C හා D ය (4) A, B හා C ය

25) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව සඳහා පුරාණ ගිවිසුමේ ලියා ඇති ග්‍රන්ථය වන්නේ
(1) හිතෝපදේශය (2) සිරාක් (3) ධර්ම දේශකයා (4) සලමොන්ගේ ප්‍රඥාව

pdfelement

26) නව අහස හා නව පොළවට ඇතුලු වීමට අප කළ යුත්තේ ........................ යි. හිස්තැනට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ

1 පවුලේ සියලු දෙනා සමඟ රූපවාහිනිය නැරඹීම
2 දිනපතා යහලුවන් සමග ක්‍රීඩා කිරීමය
3 පාපි ක්‍රියා අතහැර දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමයි
4 ජේසුස් වහන්සේගේ දුක් විඳීම සිහි කිරීමයි

27) ජේසුස් වහන්සේ ................ දින සවස අපෝස්තුලුවරුන් වෙත වැඩම කර ඔබට ..................... පවසමින් ඔවුන් ශක්තිමත් කළ සේක.
හිස්තැන් වලට සුදුසු නිවැරදි පිළිතුරු වන්නේ

(1) පාස්කු ඉරුදින / සාමය වේවා !  (2) පාස්කු ඉරු දින/ මංගල වේවා !
(3) ශුද්ධාත්ම ඉරු දින / ශාන්තිය වේවා !  (4) පාස්කු ඉරු දින / ශාන්තිය වේවා !

28) ''පියාණනි ඔවුන්ට කමා වුව මැනව : ඔවුන් කරන දෙය ඔව්හු නොදනී'' යි වදාළ සේක. ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කරන ලද්දේ :

1 කපාල පිටිය නම් ස්ථානයේ ජේසුස් වහන්සේව කුරුසියේ ඇණගැසූ අවස්ථාවේ
2 ජේසුස් වහන්සේට තිත්ත කාඩි පිලිගැන්වූ අවස්ථාවේ
3 ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ
4 ජේසුස් වහන්සේ කුරුසිය උසුලාගෙන යන අවස්ථාවේ

29) ජේසුස් වහන්සේගේ පසුපසින් උත්තම පූජකයාගේ මැඳුර දක්වා ගියේ කවුද?

(1) තෝමස් තුමා  (2) පේදුරු තුමාය  (3) ජාකොබ් තුමාය  (4) මාක් තුමාය

pdfelement

30) ''මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ බල පරාක්‍රමයේ දකුණු පස වැඩ හිඳිනු ඇත.'' මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

(1) ජේසුස් වහන්සේ විසින් හෙරෝද්ට  (2) ජේසුස් වහන්සේ විසින් වරදකරුවෙකුට
(3) ජේසුස් වහන්සේ විසින් පිලාත්ට  (4) ජේසුස් වහන්සේ විසින් ජුදයින්ට

31) ''පෙන්තකොස්තය'' යන වචනයේ අර්ථය ලියන්න

(1) හැත්තෑව  (2) හැත්තෑ තුන  (3) හතළිස් හය  (4) පනහයි

32) සන්තියාගෝ මුණිතුමාව හිසගසා මරා දමන ලද්දේ

(1) නීරෝ අධිරාජ්‍යයාය  (2) ඩොමිෂියන් අධිරාජ්‍යාය
(3) පිළාත් ආණ්ඩුකාරයා  (4) හෙරෝද් (අග්‍රිපා I)

33) උපස්ථායකයන් තුළ තිබූ ගුණාංග වන්නේ

A සහනාධාර බෙදා දීමේ හැකියාවක් තිබීම  B යහපත් දිවි පෙවෙතක් ගත කිරීම
C සුබ අස්න දේශනා කිරීමේ හැකියාවක් තිබීම  D ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම

මේවායින් නිවැරදි පිළිතුර වන්නේ

(1) A, B හා C ය  (2) B, C හා D ය  (3) B හා D ය  (4) C හා D ය

34) ''සැඩ සුළගක් හමන්නාක් වැනි හඬක් හිදිසියේ පැමිණියේ ය. ගිනි දලු වැනි දිව් බෙදී ගොස් ඔවුහු එකිනෙකා මත පිහිටියහ'' (ක්‍රියා 2 : 1 - 8 ) එයින් සංකේතවත් කළේ,

(1) ශ්‍රාවකයන්ගේ ජීවිත වෙනස් වීමයි  (2) ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනයයි
(3) ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනයයි  (4) ශ්‍රාවකයන්ට ලැබුණු දේව බලයයි

35) අපෝස්තුලුවරුන් දොළොස් දෙනා අතුරින් පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා වන්නේ

(1) ශුද්ධ වූ ජාකොබ් තුමා (2) ශුද්ධ වූ පේදුරු තුමා

(3) ශුද්ධ වූ ස්තේපන් තුමා (4) ශුද්ධ වූ ජුවාම් තුමා

36) නායක පූජකයාගේ අවසර පතක් ලබාගෙන සාවුල් තුමා කිතුනුවන් අත්අඩංගුවට ගැනීමට ගියේ

(1) ජෙරුසලමට (2) දමස්කයට (3) අන්තියෝකයට (4) ඉකෝනියට

37) ක්‍රි. ව 50 – 52 අතර කාලය තුළ දී ශුද්ධ වූ පාවුලු තුමා සමග ධර්මදූත චාරිකාවේ යෙදුනේ

(1) සීලස් තුමා / තිමොතියස් තුමා (2) බර්ණබස් තුමා / ලූක් තුමා

(3) බරණබස් තුමා / ජොහන් මාක් තුමා (4) ජොහන් මාක් තුමා / සීලස් තුමා

38) ශුද්ධ වූ පාවුලු තුමා ලැබූ ගෞරව නාමය වන්නේ

(1) ආසියාවේ ධර්මදූතවරයා (2) ශ්‍රී ලංකාවේ අපෝස්තුලුවරයා

(3) අන්‍ය ජාතීන්ගේ අපෝස්තුලුවරයා (4) රෝමයේ ධර්මදූත වරයා

39) ශුද්ධ වූ පාවුලුතුමා පළමු වන ධර්මදූත ගමනේ දී ගිය නගර

A ඉකෝනිය B මසිදෝනිය C ලුස්ත්‍රාව D දර්බය

මින් නිවැරදි පිළිතුර වන්නේ

(1) A හා C ය (2) B හා C ය (3) A, B හා D ය (4) A, C හා D ය

40) ශුද්ධ වූ පාවුලු තුමා (සාවුල්) ...................... ගෝත්‍රයට අයත්ව ........................... උපත ලැබුවේය. මෙහි හිස්තැන් වලට නිවැරදි පිළිතුර වන්නේ

(1) බෙන්ජමින් / තාර්සස්හි (2) සාබුලොන් / රෝමයේ

(3) ජුදා / රෝමයේ (4) රූබන් / ග්‍රීසියේ

pdfelement

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper II | පැය / மணித்தியாலம் / Hours 02 |

- **පළමු වන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

01

1 ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ ගැලවීමේ ඉතිහාසය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කරුණු දෙකකින් ඉදිරිපත් කරන්න

2 අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ කතුවරයා පිළිබඳ වාක්‍ය දෙකක් ලියන්න

3 ශුද්ධ වු පාවුලු තුමා ලිපි ලියන ලද්දේ කාට ද?

4 ශුද්ධ බයිබලයේ සංකේත භාවිතයෙන් ලියා ඇති කෘතීන් දෙකක් නම් කරන්න

5 ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධාන අරමුණ ලියන්න

6 ජේසුස් වහන්සේ ශ්‍රාවකයින්ට දර්ශනය වු අවස්ථා දෙකක් ලියන්න

7 ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වු ශ්‍රාවකයන් තුළ ඇතිවු වෙනස්කම් දෙකක් ලියන්න

8 පාස්කු අභිරහස යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

9 සිරකරුවෙකු ලෙෂ ශු. පාවුලු තුමාව රෝම අධිරාජ්‍යයට ගෙන යාමට හේතු වුයේ කුමක් ද?

10 ශුද්ධ වු පාවුලු තුමා ස්ථාපිත කළ සභාවන්ට සංදේශ ලියා යැවීමට හේතු වු කරුණු 02ක් ලියන්න

02

1 ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් 02 නම් කර ඊට අදාළ පොත් සංඛ්‍යාව ලියා දක්වන්න

2 අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සැකැස්ම ලියා දක්වන්න

3 ඔබගේ ජීවිතය තුළ දෙවියන් වහන්සේ අත්දුටු අවස්ථාවක් විස්තර කරන්න

03

1 හෙබ්‍රව් ප්‍රඥාවේ ප්‍රභේදයක් වන රාජ්‍ය සභා ප්‍රඥාව යනු කුමක් දැයි විස්තර කරන්න

2 ප්‍රඥාවන්තව කටයුතු කිරීම යනු කුමක් ද?

3 සලමොන් රජතුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 05ක් ලියා විස්තර කරන්න

04

1 ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගෙන ගොස් ''ඔබ ක්‍රිස්තු ද ?'' යන ප්‍රශ්නයට ජේසුස් වහන්සේ දුන් පිළිතුර කුමක් ද?

2 ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ සිදු වූ සිදුවීම් 03ක් ලියන්න

3 ජේසුස් වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කළ පේදුරු තුමා පසුව මනස්ථාප වී දුකින් හැඬුවේය. එම සිද්ධිය තුළින් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 05ක් ලියන්න

05

1 මුල් කිතුනු සභාවේ ලක්ෂණ 04ක් ලියන්න

2 පේදුරු තුමාගේ දේශනයේ අඩංගු කරුණු 03ක් ලියන්න

3 අභිවෘද්ධි ආලේපය ලැබූ ඔබ අද සමාජයේ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට ගත හැකි ක්‍රියා මාර්ග 05ක් ලියා විස්තර කරන්න

06

1 ශුද්ධ වූ පාවුලු තුමා ලිපි (හසුන්) ලිවීමේ පරමාර්ථ 02 ලියන්න

2 ධර්මදූත චාරිකා වලදී ශුද්ධ වූ පාවුලු තුමටා මුහුණ දීමට සිදු වූ අභියෝග 03ක් ලියන්න

3 ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතය ආදර්ශයට ගනිමින් ඔබට මීසම තුළ කළ හැකි ක්‍රියාවන් 05ක් නම් කර විස්තර කරන්න

07

පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන එකකට පේළි 12 කට නොඅඩු වනසේ කෙටි සටහන් ලියන්න

1 නව ගිවිසුමේ පොත් වර්ගීකරණය — 2 පෙන්තකොස්තය

2 ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්ම දූත චාරිකා — 4 ශුද්ධ වූ බයිබලය

pdfelement

## කතෝලික ධර්මය

## 10 ශ්‍රේණිය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| **1 – 2** | **11 – 1** | **21 – 3** | **31 – 4** |
| **2 – 3** | **12 - 2** | **22 – 2** | **32 - 4** |
| **3 - 4** | **13 – 1** | **23 – 2** | **33 – 3** |
| **4 – 1** | **14 – 3** | **24 – 4** | **34 – 2** |
| **5 – 4** | **15 – 4** | **25 - 1** | **35 – 1** |
| **6 – 3** | **16 – 2** | **26 – 3** | **36 – 2** |
| **7 – 3** | **17 – 3** | **27 – 4** | **37 – 1** |
| **8 – 2** | **18 – 2** | **28 – 1** | **38 – 3** |
| **9 – 1** | **19 – 1** | **29 – 2** | **39 – 4** |
| **10 – 4** | **20 – 4** | **30 – 3** | **40 - 1** |

### II පත්‍රය

(01)

1 ඉශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම් හා සිද්ධීන් විශ්වාසයේ ඇසින් අර්ථකතනය කිරීමයි

2

- අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාපොතේ කතුවරයා ශුද්ධ වූ ලූක් තුමාය
- ලූක් ශුභාරංචියේ ද කතුවරයාය
- එතුමාගේ මෙම කෘතීන් දෙකම කැපකර ඇත්තේ තියෝපිලස් තුමාටය

3 විවිධ සංසවලට හා පුද්ගලයන්ට

4 දානියෙල් පොත එළිදරව් පොත

5 බුද්ධිමය ව්‍යායාමයකට වඩා ධර්මිෂ්ඨ හා නිවැරදි ලෙස දිවි ගෙවීමට දේව ජනතාව උනන්දු කොට දෙවියන් වහන්සේට ප්‍රියමනාප දිවියක් ගත කිරීමයි

6

- ගෝලයන් දෙදෙනකු ජෙරුසලමේ සිට ''එම්මාවුස්'' ගමට යමින් සිටිය දී
- පාස්කු ඉරු දින හවස අපෝස්තුලුවරුන්ට දර්ශනය වීම හා ''පවු කමා කිරීමේ බලය''ඔවුන්ට දානය කිරීම
- උත්ථානයෙන් දින අටකට පසු තෝමස් අපෝස්තුලුවරයාට දර්ශනය වීම

7

- අන්‍ය භාෂා වලින් කථා කිරීම
- ප්‍රබලව ශ්‍රාවකයන්ගේ ජීවිත වෙනස් වීම
- එඩිතරව දේව වචනයේ සාක්ෂිකරුවන් වීම

8 ජේසුස් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානයයි

9 ශුභාරංචිය දේශනා කිරීමේ අරමුණින් පාවුලු තුමා තම රෝම පුරවැසි භාවය පදනම් කරගෙන රෝම අධිරාජයාගේ විනිශ්චය ඉල්ලූ නිසා

10

- සභාවන් හි විවිධ ගැටලු නිරාකරණය කිරීමට
- කිතුනු ඇදහිල්ල හා යුතුකම් පෙන්වා දීමට
- ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනය පවත්වා ගැනීමට
- ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය පිළිබඳ ගැටලු වලට පිළිතුරු දීමට

(2) 1 පුරාණ ගිවිසුම පොත් 46
නව ගිවිසුම පොත් 27

pdfelement

2

- ධර්මදූත සේවයට සූදානම
- ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම
- ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය

3 සිසුවාගේ පිළිතුර ප්‍රශ්ණයට අදාලව ලියා ඇත්නම් ලකුණු දෙන්න (ලකුණු 2 + 3 + 5 = 10)

(03) 1 රාජ්‍ය පාලනය හා අනෙකුත් පරිපාලන ක්ෂේත්‍රයන් ඉලක්ක කරගෙන යෞවනයන් පුහුණු කිරීම මෙහි අරමුණයි. බොහෝ දුරට සමාජයේ ප්‍රභූ පන්තිය සඳහා වූවකි

2 එදිනෙදා ජීවිතය තුළ යහපත පමණක් තෝරා ගෙන කටයුතු කිරීමයි
දේව මැදිහත් වීම තුළ පමණක් එසේ කිරීමට හැකි නිසා දිනපතා ඒ සඳහා දෙවිඳුන් යදිමු

3 සිසුවාගේ පිළිතුර බලා ලකුණු ලබා දෙන්න (ලකුණු 2 + 3 + 5 = 10)

(04) 1 ''මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමයේ දකුණු පස වැඩ හිඳිනු ඇත''

2 හිරු අඳුරු විය රට පුරා අන්ධකාරයක් පහල විය දේව මාලිගාවේ තිරය දෙකඩ වී ඉරී ගියේය

3 සිසුවාගේ පිළිතුරට අනුව ලකුණු දෙන්න (ලකුණු 2 + 3 + 5 = 10)

(05) 1

- ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම්
- සහභාගිකම
- රොටී කැඩීම (දිව්‍ය පූජාව)
- යාච්ඤාව

2

- ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව
- ඉශ්‍රායෙල් ජනතාව ජේසුස් වහන්සේව කුරුසපත් කළ නමුත් දෙවියන් වහන්සේ උන් වහන්සේව උත්ථාන කළ බව
- දෙවියන් වහන්සේගේ දකුණු පස ජේසුස් වහන්සේ වැඩ සිටින බව

3 සිසුවාගේ පිළිතුරට (7 ශ්‍රේණියේ 25 පිටුව) ජීවිත සාක්ෂි දැරීම ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(06) 1

- කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ අපහසුව
- සිරගතව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නොහැකියාව

2

- සිරගත කරනු ලැබීම
- ගල්ගසා නගරයෙන් පිටතට ඇද දැමීම
- ජුදයින්ගේ විරෝධයට ලක් වීම

3 සිසු පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න (3 හා 8 පාඩම් ඇසුරින්)

(07) 1 (දෙවන පාඩම)
2 (හත්වන පාඩම)
3 (අටවන පාඩම)
4 (පළමු පාඩම - දෙක පිටුව)

pdfelement